**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**

**මොනරාගල දිස්ත්‍රික්කය**

**--------------------------------**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

**(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. 451,100 ක ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙසට ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් තැබීමේ දී මෙවන් දෝෂ මගහරවා ගැනීමට විෂය භාර නිලධාරිණියට උපදෙස් දුන් බව දන්වමි. |

**(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 172,923,500 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සඳහා තක්සේරු වාර්තා සහ අයිතිය තහවුරු කිරීමේ ලියවිලි ද රු. 5,268,853 ක් වූ පොදු තැන්පත් ශේෂය සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද පොදු තැන්පත් ලේඛනය ද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේ දී විධිමත් තක්සේරු වාර්තා ලබා ගැනීමට 2020 වර්ෂයේ සිට පොදු තැන්පත් ලේඛනය නිවැරදි කර යාවත්කාලීන කිරීමටද, විෂය භාර |

| | | | නිලධාරිණියට උපදෙස් දුන් බව දන්වමි. |
|---|---|---|---|

**1.4 <u>අනුකූල නොවීම්</u>**

**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | | | |
| (i) 134(1) වගන්තිය | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකරගෙන නොතිබුණි | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වරිපනම් බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වමි. |
| (ii) 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමතකර ඇති ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන හෝටල් සහ නවාතැන්පොළ පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මෙම කටයුතු විධිමත් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කළ බව දන්වමි. |
| **(ආ) <u>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වගන්තිය</u>** | ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් ඉදිරිපත් කර ඇති කළමනාකරණ විගණන වාර්තාව සඳහා ප්‍රතිචාර දක්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මෙම කටයුතු විධිමත් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කළ බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</u><br>XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | 2004 වර්ෂයට පෙර සිට ගිණුම්වල දැක්වෙන සභාවේ සේවය කළ සේවකයින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 34,289 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. | හිඟ සේවක ණය අය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම සේවකයින් 04 දෙනාගේ ණය ලිපිගොනු හෝ ඇපකරුවන් හෝ සොයාගත නොහැකි බවද, එකල සේවයේ යෙදී සිටි නිලධාරීන්ගෙන් හෝ එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) **<u>1956 අංක 28 දරන පනතින් සංශෝධිත 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥා පනත</u>** | සභා බලප්‍රදේශය තුල ඉදිකරනු ලබන ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීමට ගොඩනැගිලි සැලසුම් කමිටුවක් පිහිටුවා නොතිබුණි. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමට සැලසුම් කමිටුවක් පිහිටුවිය යුතුවේ. | 2020 වර්ෂයේ දී ගොඩනැගිලි සැලසුම් කමිටුවක් පිහිටුවා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සැලසුම් අංශයට උපදෙස් දුන් බව දන්වමි. |

**2.** <u>මූල්‍ය සමාලෝචනය</u>

**2.1** <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,347,178 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,507,159 ක් විය.

**2.2** <u>ආදායම් පරිපාලනය</u>

**2.2.1** <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම රු. | 2019 බිල් කළ ආදායම රු. | 2019 රැස්කළ ආදායම රු. | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2018 ඇස්තමේන්තුගත ආදායම් රු. | 2018 බිල් කළ ආදායම රු. | 2018 රැස්කළ ආදායම රු. | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | කුලී | 12,820,800 | 11,928,625 | 10,252,533 | 1,847,692 | 15,145,147 | 9,737,317 | 9,851,573 | 38,169 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 1,782,500 | - | 1,285,100 | - | 1,613,000 | - | 1,793,370 | - |
| (iii) | වෙනත් ආදායම් | 15,980,891 | 4,643,136 | 12,604,342 | 1,347,441 | 9,394,000 | 6,054,351 | 9,562,142 | 2,616,201 |
| | එකතුව | 30,584,191 | 16,571,761 | 24,141,975 | 3,195,133 | 26,152,147 | 15,791,668 | 21,207,085 | 2,654,370 |

### 2.2.2 කඩ කාමර කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවට අයත් කඩකාමර 39 කින් රු. 131,639 ක් සහ 2015 ජනවාරි මස කඩා ඉවත් කර තිබුණු කාමර 5කින් අයවිය යුතුව තිබුණු රු. 36,750 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කඩ කාමර කුලී අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධව සමථ මණ්ඩලය වෙත ලිපි මඟින් දැනුවත් කර ඇති බවද, ඉදිරි කටයුතු සඳහා ක්‍රියාත්මක වීමට විෂය භාර නිලධාරිනියට උපදෙස් දුන් බව දන්වමි. |
| (ආ) 2013 ජුනි 28 දිනැති සභා තීරණයක් අනුව ඇතිමලේ සතිපොළෙහි පිහිටි විවෘත කඩකාමර 32 ක් නැවත බදු නොදීමට තීරණය කර තිබුණු අතර ඉන් කඩ කාමර 18 ක් සඳහා එදිනට හිඟව පැවති රු. 71,400 ක කුලිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි. | හිඟ කඩ කාමර කුලී අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධව සමථ මණ්ඩලය වෙත ලිපි මඟින් දැනුවත් කර ඇති බවද, ඉදිරි කටයුතු සඳහා ක්‍රියාත්මක වීමට විෂය භාර නිලධාරිනියට උපදෙස් දුන් බව දන්වමි. |

**2.2.3** <u>ජල ගාස්තු ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු. 95,688 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | 2020.05.31 දින වන විට රු.79,012 ක් අයවී ඇති බවද, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නිවේදන යවා ඇති බව දන්වමි. |

**2.2.4** <u>පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබානොදීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් 28 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණු බැවින් එක් බලපත්‍රයකට රු. 4,000 බැගින් රු. 112,000 ක ආදායමක් අහිමිවී තිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතුවේ. | එකී ක්‍රියාකාරකම් පවත්වාගෙන යන ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීමෙන් අනතුරුව ක්‍රියාකාරකම් 07ක් සඳහා බලපත්‍ර ලබාගෙන ඇත. |

**2.2.5** <u>වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සහා බලප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර පිළිබඳව සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | 2021 වර්ෂයේ සිට සියළුම වෙළඳ ස්ථාන හඳුනාගෙන ලේඛනගත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

**2.2.6** <u>ව්‍යාපාර හා කර්මාන්ත බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සහා බලප්‍රදේශයේ ව්‍යාපාර හා කර්මාන්ත බදු ගෙවිය යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ව්‍යාපාර හා කර්මාන්ත බදු ගෙවිය යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | 2021 වර්ෂයේ සිට සියළු ව්‍යාපාර හා කර්මාන්ත බදු අයකළ යුතු ස්ථාන හඳුනාගෙන බදු අයකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

**2.2.7** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවෙන් රු. 249,750 ක උසාවි දඩ සහ රු. 4,561,289 ක මුද්දර ගාස්තු අයවිය යුතුවේ. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුද්දර ගාස්තුවලින් රු. 2,787,343 ක් සහ හිඟ උසාවි දඩ මුදලින් රු. 232,333 ක් 2020 වර්ෂයේදී අයවී ඇති බවද, ඉතිරි මුදල් අයකර ගැනීමට නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

**2.3** <u>අධිභාර</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 138,017 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | හිඟ අධිභාර අය කර ගත යුතුවේ. | 2020 වර්ෂයේදී රු.10,000 ක් අයවී ඇති බවද, හිටපු සභාපති තුමාගෙන් අයවිය යුතු රු.110,008.33 ක මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට විෂය භාර නිලධාරිණියට උපදෙස් දුන් බව දන්වමි. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන මෙන් සැලසුම් අංශයට උපදෙස් දුන් බව දන්වමි. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේ දී තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව දර්ශක හඳුනාගෙන කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

### 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 ජූනි 05 දින ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණු සියඹලාණ්ඩුව සතිපොළ පරිශ්‍රයේ කඩකාමර 10 ක් 2020 ජනවාරි 09 දින වන විටත් බදුදී නොතිබුණි. | කඩකාමර බදු දීමට කටයුතු කළ යුතුවේ. | නැවතත් මෙම කඩ කාමර බදු දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් වාහන 03 ක් නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතියද ඒවා අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී මෙම වාහන අළුත්වැඩියාකර, සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට විෂය භාර නිලධාරිණියට උපදෙස් දුන් බව දන්වමි. |
| (ඇ) | 2012 වර්ෂයේ දී ආරම්භකර තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුවේ. | 2020 වර්ෂය තුළ දී ප්‍රතිකර්ම පද්ධතියක් ස්ථාපිත කර පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට අදාල නිලධාරියාට උපදෙස් ලබා දුන් බව දන්වමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 7 කට අදාලව සේවක පුරප්පාඩු 08 ක් හා තනතුරු 7 කට අදාලව 22 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු පුරවාගත යුතු අතර අතිරික්ත සේවක සංඛ්‍යාව අනුමතකරගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දීමට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කොට අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**3.4** <u>වත්කම් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ------------------ |
| (අ) | 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | 2020.08.31 දිනට ප්‍රථම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර, ලේඛනගත කිරීමට විෂය භාර |

| | | | |
|---|---|---|---|
| | | | නිලධාරිනියට උපදෙස් දුන් බව දන්වමි. |
| (ආ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 8 ක මැනීම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 73 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර නීත්‍යානුකූල අයිතිය සභාවට ලබාගත යුතුවේ. | ඉඩම් 8හි මැනුම් කටයුතු සිදුකර, සියළු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සඳහා විෂය භාර නිලධාරිණියට උපදෙස් දුන් බව දන්වමි. |
| (ඇ) | සභා බලප්‍රදේශයේ පිහිටා ඇති මාර්ග 140 ක් හඳුනාගෙන තිබුණද මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර සභාවට අයත් මාර්ග ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත්කළ යුතුවේ. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට අදාල නිලධාරියාට උපදෙස් දුන් බව දන්වමි. |
| (ඈ) | ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 569,496 ක ශේෂ පැවති ඉතිරි කිරීමේ ගිණුම් 03 ක් අක්‍රීයව පැවතුණි. | අක්‍රීය ගිණුම්වල ශේෂ ප්‍රයෝජනයට ගත යුතුවේ. | මෙම ගිණුම්වල මුදල් ගමනැගුම අන්තර් ගම්මාන නියමු ව්‍යාපෘතියට අයත් කාර්යයන් සඳහා යොදවා ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

**3.5** <u>වාහන උපයෝජනය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | -------------- | ------------------- |
| (අ) | සභාවට අයත් යන්ත්‍ර 4 ක් 2019 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුල රු. 776,560 ක ඉන්ධන වියදම් දරා මීටර් පැය 958.32 ක් ධාවනය කර, කර්මාන්ත 74 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා තිබුණි. එහෙත් එම කර්මාන්තවලට අදාලව නිමි වැඩ වාර්තා පිළියෙල කර නොතිබුණු අතර කර්මාන්ත 50 ක ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | මින් ඉදිරියට ඇස්තමේන්තු සකස් කර වාහන යෙදවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් යන්ත්‍රෝපකරණ 3 ක් 2014 වර්ෂයේ සිට 2019 ජූලි දක්වා කුලියටදීම වෙනුවෙන් රු. 266,025 ක කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකරගත යුතුවේ. | 2020 වර්ෂයේ දී මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් විෂයභාර නිලධාරිණියට උපදෙස් දුන් බව දන්වමි. |

**3.6** ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මෙහි සියළුම භාණ්ඩ වැඩ හා සේවා සපයා ගැනීම් ඇතුළත් කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී මෙවන් දෝෂ මඟහරවා ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් බව දන්වමි. |

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**4.1** අභ්‍යන්තර විගණනය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන කාර්තු දෙක තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා එකී කටයුතු විධිමත් කිරීමට අදාල නිලධාරියාට උපදෙස් දුන් බව දන්වමි. |

**4.2** විගණන හා කළමනාකරණ කමිටු

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන කාර්තු දෙක තුළ විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. |